**කුරුවිට ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 07 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළිය රු. 1,652,055 ක් ආදායම් ගිණුමට බැර නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් සභා හා විමධ්‍යගත ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබියයුතු වූ හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු වූ එකතුව රු. 99,203,300 ක් ණයගැතියෝ හා ණයහිමියෝ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් අපහරණය කිරීමට නිර්දේශ කර තිබූ එකතුව රු. 11,734 ක් වූ ලී බඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත් අපහරණය කිරීමට පෙර ගිණුම් ශේෂයට ගලපා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ එකතුව රු. 359,000 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) රු. 85,500 ක ආයුර්වේද ආධාර රු. 185,500 ක් වශයෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා 2017 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ඖෂධ තොගය රු. 100,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මහේස්ත්‍රාත් අධිකරණයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට ගෙවීම සඳහා ලැබී තිබුණු රු. 16,250 ක් උසාවි දඩ ලැබීම් වශයෙන් සටහන් කර තිබීම හේතුවෙන් අයවිය යුතු උසාවි දඩ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(උ) 2018 වර්ෂය වෙනුවෙන් කලින් ලද වරිපනම් ගාස්තු රු. 298,332 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාලව 2018 මාර්තු මාසයේදී ගෙවීම් කර තිබූ එකතුව රු. 290,480 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 22,059,770 ක වෙනසක් පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අගයන් සහ ඊට අදාල සටහන් වල දැක්වෙන අගයන් අතර එකතුව රු. 23,488,355 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සන්සන්දනාත්මකව දක්වා තිබූ ඉකුත් වර්ෂයට අදාල වටිනාකම් හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ වටිනාකම් සැසඳීමේදී ගිණුම් විෂයයන් 08 කට අදාලව එකතුව රු. 32,570,886 ක වෙනසක් පැවතුණි.

(ඈ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු දේශීය ණය සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 44,875 ක් වුවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද ණය තොරතුරු අනුව එවැනි ශේෂයක් නොතිබුණි.

(ඉ) ආසියානු සංවර්ධන ණය අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 9,435,811 ක් ලෙස දක්වා තිබුණද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද ණය තොරතුරු අනුව ගෙවිය යුතු ණය ශේෂය රු. 9,046,211 ක් වූයෙන් රු. 389,600 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

ණයහිමි ලේඛනය අනුව 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතු ණයහිමි ශේෂය රු. 7,886,701 ක් විය.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 158,436,971 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>204 වන රීතිය | 11,350 | 2016 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය කර තිබූ භාණ්ඩ ඒකක 11 ක ඌනතාවය සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | 2017 නොවැම්බර් වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 3,090,069 | 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ලබාදී තිබූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 11,530,994 | 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (ආ) මාර්ගෝපදේශය | 264,000 | මිලදී ගන්නා ලද පරිගණක නියමිත පිරිවිතර වලට අනුකූල බවට වූ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව පෞද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,298,073 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,301,090 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,313,624 | 3,551,623 | 4,222,649 | 3,854,219 | 2,419,591 | 1,830,205 | 1,599,919 | 4,556,262 |
| කුලී | 7,345,665 | 6,608,828 | 6,626,857 | 2,598,147 | 6,413,436 | 3,182,256 | 6,416,818 | 1,908,571 |
| බලපත්‍ර ගාස්තු | 1,773,000 | 2,643,275 | 2,636,040 | - | 1,451,100 | 2,179,154 | 2,179,154 | - |
| වෙනත් ආදායම් | 41,701,040 | 38,762,500 | 21,345,725 | 40,027,736 | 18,230,482 | 38,068,035 | 29,512,346 | 23,356,188 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 82, සියයට 49, සියයට 02, සියයට 68 හා සියයට 49 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 10 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 3,499,290 ක් වූ අතර, ඒ තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 377 කින් අයවිය යුතු එකතුව රු. 2,293,068 ක් පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

**(ආ) අක්කර බදු**

2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ අක්කර බදු රු. 4,099,057 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 2.2.4 කුලී

2009 වර්ෂයේදී බදු පදනම මත ලබාදී තිබූ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05ක් සඳහා ආරම්භයේ සිටම බදු අය නොවීම හේතුවෙන් 2014 ජූලි 30 දින එම කඩ කාමර මුද්‍රා තබා සභාව වෙත පවරා ගෙන තිබුණි. බදු කරුවන් සමඟ ගිවිසුම්ගත නොවීම නිසා සභාවට ලැබිය යුතු එකතුව රු. 4,436,000 ක් වූ හිඟ කඩ කාමර කුලී සහ දඩ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බව දක්වමින් හිඟ කඩ කුලිය කපා හැරීම සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර තිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල පිහිටි කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ව්‍යාපාර ස්ථාන හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව 2016 හා 2017 වර්ෂ තුල පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කලයුතු ව්‍යාපාරික ස්ථාන 14 ක් බලපත්‍ර අළුත් කර නොතිබීම හේතුවෙන් සභාවට රු. 61,600 ක් අහිමි වී තිබුණු අතර එකී කර්මාන්ත පවත්වාගෙන යාමේදී සිදුවියහැකි පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් සිදුකර නොතිබුණි.

## 2.2.6 වෙනත් ආදායම්

-------------------

සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු ස්ථිර දැන්වීම් පුවරු 02 කින් ලැබිය යුතු එකතුව රු. 90,000 ක් වූ ආදායම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.2.7 මුද්දර ගාස්තු

--------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාලපරිච්ඡේදයට අදාලව අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අයවිය යුතු එකතුව රු. 822,151 ක් වූ මුද්දර ගාස්තු ආදායම 2018 මාර්තු වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාලව රත්නපුර හා හොරණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

සභාවේ උප කාර්යාල 02 කට අදාලව රැස්කිරීමේ ගිණුම් ලෙස පවත්වාගෙන යන ජංගම ගිණුම් 02 ක ශේෂයන් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යයව පවතින අතර, 2017 අගෝස්තු 31 දින වනවිට එම ගිණුම් දෙකෙහි එකතුව රු. 3,884,521 ක් විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුළ එකතුව හෙක්ටයාර් 2.6 ක් වූ ඉඩම් කට්ටි 82 ක් සමාලෝචිත වර්ෂයේදී කට්ටි කර විකිණීම පිළිබඳව 2017 දෙසැම්බර් 14 දින වනවිටත් සභාව විසින් අනාවරණය කරගෙන නොතිබුණි. අදාල දේපල වෙළඳාම් සමාගමේ වෙබ් අඩවියෙන් ලද තොරතුරු අනුව එදින වනවිට ඉඩම් කට්ටි 33 ක් විකුණා අවසන්වී තිබුණු නමුත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමෙන් ලැබෙන සියයට 01 ක ආදායම සභාවට ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ආ) 1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි නියෝග වල 22 වන නියෝගය ප්‍රකාරව කට්ටි කරන ඉඩමෙන් පර්චස් 102 ක ප්‍රමාණයක් පොදු කටයුතු වෙනුවෙන් වෙන්කර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පරකඩුව, ඉසුරු පෙදෙස, පැරඩයිස්වත්ත ඉඩම් විකිණීමේදී පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා දී තිබූ පර්චස් 184.7 ක ඉඩම් කොටස තුල අසල නිවැසියෙකු විසින් අනවසරයෙන් නළ ළිඳක් ඉදිකර එය පෞද්ගලිකව භාවිතා කරමින් පැවතුණි. අදාල ඉඩම් කොටසෙහි ආරක්ෂාව හා අපේක්ෂිත අරමුණු කරා යෙදවීම සම්බන්ධයෙන් සභාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය තුල සිදුකර තිබුණු ඉඩම් විකිණීම් 03 කට අදාලව නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් බදු අයකිරීම හේතුවෙන් සභා අරමුදලට රු. 764,444 ක ආදායමක් අහිමි වී තිබුණි. අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් සභාව අපොහොසත් වී තිබුණු අතර පනතේ 154(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද යොමුවී නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

------------------------------

**වත්කම් ලේඛනගත නොකිරීම**

-----------------------------------

සභාව සතු දේපල, පිරියත හා උපකරණ විධිමත්ව ලේඛනගත කර නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

---------------

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර තිබූ නඩුකාරදෙනිය අතුරු මාර්ගය, නියමිත ප්‍රමිතියට ඉදිකර නොතිබීම හේතුවෙන් වර්ෂා ජලයෙන් යට වෙමින් පැවති අතර ඊට පිළියම් ලෙස සභාව විසින් නැවත වරක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර තිබුණි. එහෙත් මාර්ගයේ දකුණු පසින් ජලය බැස යන ආකාරයෙන් කාණුවක් ඉදි කර නොතිබීම හේතුවෙන් සමස්ථ මාර්ගයම තවදුරටත් වර්ෂා ජලයෙන් යටවෙමින් පැවතුණි. ඒ අනුව කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණු අතර, එකතුව රු. 247,815 ක් වූ වියදම නිෂ්ඵල වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල රු. 1,981,740 ක් වැයකර පරකඩුව අලුපන වෙල්යාය මාර්ගය කොන්ක්‍රීට් කර තිබුණ ද, සංවර්ධනය කිරීමට පෙර මාර්ගය දෙපස සවිකර තිබූ විදුලි කණු ඉවත් කර මාර්ගයට බාධාවක් නොවන පරිදි නැවත සවිකිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් මාර්ගය පුළුල් කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.එමෙන්ම වැසි ජලය බැස යන ආකාරයට කොන්ක්‍රීට් කර නොතිබීම හේතුවෙන් වැසිජලය මාර්ගය තුල ඒකරාශි වී ගමනාගමනයට බාධාවී තිබුණි.

(ඇ) සභාව විසින් සිදුකර තිබූ කොන්ක්‍රීට් අතුරා මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකල භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු පහත දැක්වේ.

(i) ඉදිකරනු ලබන මාර්ගයන්හි මාර්ග උරහිස (Edges) පස්/බොරළු යොදා තලා සකස් කළයුතු වුවද, නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද කිසිදු මාර්ගයක මාර්ග උරහිස් පස්/බොරළු යොදා තලා නොතිබුණි.

(ii) කොන්ක්‍රීට් කරන මාර්ගයන්හි පාදම ක්ෂේත්‍රයේ ස්වභාවය සහ පසේ ස්වභාවය අනුව නියමිත ප්‍රමිතියෙන් කොන්ක්‍රීට් කර නොතිබීම හේතුවෙන් වාහන ගමනාගමනයේදී කොන්ක්‍රීට් ස්ථරයට එම පීඩනය දරාගත නොහැකිවීමෙන් මාර්ගයන්හි අතුරන ලද කොන්ක්‍රීට් ස්ථරයන් පුපුරා තිබුණි.

(iii) මාර්ගයන්හි අතුරනු ලැබූ කොන්ක්‍රීට් නියමිත සම්පීඩන ශක්තියෙන් යුක්තදැයි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකස් කරගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

### 4.1 අයවැය පාලනය
------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 12 කට ඇති කර තිබූ එකතුව රු. 2,347,300 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 02 කට අදාලව ඇති කර තිබූ එකතුව රු. 420,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 99 ඉතිරිවීම් පැවතුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය
-------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන
---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන වටිනාකම් හා සටහන් වල වටිනාකම් අතර නොසැසඳීම් පැවතීම |
| | | (ii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iii) | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ඉකුත් වර්ෂයේ සන්සන්දනාත්මක වටිනාකම් වල නොසැසඳීම් පැවතීම |
| | | (iv) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| | | (v) | තහවුරු සාක්ෂි නොමැති වීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | | ලේඛනගත කර නොතිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | නියමිත ආදායම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | ව්‍යාපෘති/ කොන්ත්‍රාත් | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම |